# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2105/15 - 2019 ජනවාරි මස 07 වැනි සඳුදා - 2019.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මාගේ අංකය :* KDS/AKU/4/2/1/65.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/4/2016/LO/327.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරලේ අලවතුගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2018.12.06 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6868 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් දැක්වෙන අම්බලන්පිටියවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0592 ක් පමණ වන පහත මායිම් තුල පිහිටි ඉඩම් කොටස;

01. **කැබලි අංක 01 - ඉඩමේ නම: අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0084;**

*මායිම්:*

උතුරට: මු.පි.ඒ 2222 හි කැබලි අංක 5 සහ එම්.ඕ.ඒ.කරීම් සහ තවත් අය හිමිකම් කියන අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර; නැගෙනහිරට: කැබලි අංක 02; දකුණට: කැබලි අංක 02 සහ මු.පි මහ 1527 හි කැබලි අංක 1; බටහිරට: මු.පි මහ 1527 හි කැබලි අංක 1 සහ මු.පි ඒ 2222 හි කැබලි අංක 05.

02. **කැබලි අංක 02 - ඉඩමේ නම: අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0508;**

*මායිම්:*

උතුරට: මුපි මහ 1527 හි කැබලි අංක 1, මෙම පිඹුරේ කැබලි අංක 1 සහ එම්.ඕ.ඒ. කරීම් සහ තවත් අය හිමිකම් කියන අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර; නැගෙනහිරට: පාර; දකුණට: ඒ.සී.එම්. ෆවුසර් සහ තවත් අය හිමිකම් කියන අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර සහ

1A - G 29205 - 27 (2019/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ආර්.ආර්.එම්. පුංචි බණ්ඩා හිමිකම් කියන අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර; බටහිරට: ආර්.ආර්.එම්. පුංචි බණ්ඩා හිමිකම් කියන අම්බලන්පිටියෙවත්ත සහ හපුගොඩදෙනිය කියන කුඹුර සහ මුපි මහ 1527 හි කැබලි අංක 1.

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් ඃ නොදනී

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019.02.01 වැනි දින පෙ.ව. 10.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019.02.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

මාධව වර්ණකුලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2019 ජනවාරි මස 01 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-519